<u>**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**</u>

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **අහිතකර විගණන මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වු මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2012 මැයි 08 දින විගණකාධිපති වෙත භාරදී තිබු 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි ලෙජර් ගිණුම් 35ක ශේෂයන් රු 133,811,625 කින් ශේෂපිරික්සුම සමඟ නොසැසඳීම හේතුවෙන් 2012 මැයි 28 දින ඉවත්කර ගන්නා ලද අතර එම වරද නිවැරදි කර 2010 සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 ඔක්තෝබර් 08 දින නැවත භාරදී තිබුණි.

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පහත සඳහන් කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදි නොවන බවටත් , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 ට අනුකූල නොවන බවටත් නිරීක්ෂණය කෙරේ.

(i) ආදායම් වියදම් ගිණුමෙන් ජනිත වු රු. 3,053,936 ක් වු ඌනතාවය රු. 9,063,237 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබීම.

(ii) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වු මුදල් , මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබීම.

(iii) රු.22,800 ක් වු විවිධ තැන්පත් මුදල් ගලායාම , රු. 16,687 ක මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබීම.

(iv) රු. 4,189,781 ක්වු ඉඩම් හා ගොඩනැගිලි සහ යන්ත්‍ර හා පිරියත මිලදී ගැනීම් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබීම.

(v) රු. 914,494 ක් වු පුස්තකාල පොත් මිලදී ගැනීම, රු. 5,213,767 ක් ලෙස මුදල් ප්‍රවාහය තුළ දැක්වීම.

(vi) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවූ නමුත් රු.142,603 ක වටිනාකමක් පෙර වර්ෂ ගැලපුම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස මුදල් ප්‍රවාහයට ගලපා තිබීම.

(vii) ත්‍යාග හා ප්‍රදාන , සංචිත හා වෙන්කිරීම් සහ විවිධ ජංගම වත්කම් සංචලන වටිනාකම් නිවැරදි නොවීම.

(viii) ගණනය කිරීමේ දෝෂ පැවතීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂ අවසාන මුදල් ශේෂය රු.2,439,913 කින් වෙනස්වීම.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවක පාර්තෝෂික ප්‍රතිපාදනය කළ යුතු වුවත් 2009 හා 2010 වර්ෂයන්හි ඒ ආකාරයට ගිණුම් ගලපා නැති අතර වාර්ෂිකව ගෙවනු ලබන පාර්තෝෂික මුදල් ආදායම් හා වියදම් ගිණුමට ලියාහැර තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

"පරිගණක හා උපකරණ" 20% බැගින් ක්ෂය කිරීම මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය බවට මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර තිබූ නමුත් ඒ සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් ද, වෙනම ලෙජර් ගිණුමක් ද නඩත්තු නොකර, ඒවා "ලී බඩු හා උපකරණ" යටතේ ගිණුම්ගත කිරීම නිසා එහි පිරිවැය හඳුනාගත නොහැකිව, 10% බැගින් ක්ෂය කර තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2009 දෙසැම්බර් 31 දිනට රු. 3,109,584 කින් මූල්‍ය ප්‍රකාශන හා ලෙජර් ශේෂ අතර පැවති වෙනස්කම් හඳුනාගෙන ජර්නල් සටහන් මගින් නිවැරදි කර ලෙජර් ගිණුම් ආශ්‍රයෙන් ශේෂ පිරික්සුම පිළියෙල කරනු වෙනුවට, පරිගණකගත මුදල් පොතේ මාසික සාරාංශ එකතුවට නිවැරදි නොවූ ආරම්භක ශේෂ හා වර්ෂය තුළ වූ ජර්නල් සටහන් ගලපා ලබාගත් ශේෂ පිරික්සුම ආශ්‍රයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) සමුච්චිත අරමුදල , ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන , ආධාර හා ත්‍යාග සහ සුනාමි ආධාර යන ගිණුම්වලට අදාල සියළු ගැලපීම් ශේෂපත්‍රය මතුපිට සිදුකර තිබූ

අතර පෙර වර්ෂයේදී ඒ ආකාර වු ගැලපීම් වල සිදුවී තිබු දෝෂයන්ද නිවැරදිකර නොතිබීම හේතුවෙන් ගිණුම් සැසඳීම කළ නොහැකි වී තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ දී රු. 1,000,000 ක්වු රජයේ ප්‍රාග්ධන ආධාර පුනරාවර්තන ආදායම් ලෙස ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේ හර සටහන සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ආදායම් ගිණුමට ගැලපීම හේතුවෙන් රු. 1,000,000 කින් වර්ෂයේ ඌනතාවය වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

(ඈ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා ගෙන ගොස් නොතිබු අතර සමාලෝචිත වර්ෂය අවසානයේ දී එම ගිණුමේ වැය නොකළ රු. 12,683,621 ක් වු ශේෂය, මණ්ඩලයේ මුදල් ශේෂය තුළ හෝ වෙනත් ආයෝජනයන් වශයෙන් දක්නට නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොකිරීම නිසා වර්ග 09 ක් යටතේ දක්වා තිබු රු. 187,346,822 ක් වු මුළු ස්ථාවර වත්කම් පිරිවැය සකස් වු ආකාරය සහ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වු වත්කම් හදුනාගත නොහැකි වී තිබුණි.

(ඊ) යුනෙස්කෝ ආධාර වලින් මිලදීගත් රු.63,000 ක් වු පරිගණකයක් හා ජාත්‍යන්තර පොත් හුවමාරුවෙන් ලැබුණු රු. 43,618 ක් වු පොත් "ත්‍යාග හා ප්‍රදාන" ගිණුමට ගැලපීම වෙනුවට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හරකර තිබුණි.

(උ) රු. 35,600 ක සාවද්‍ය වටිනාකමක් මෝටර් රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම හා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම හර කර මෝටර් රථ ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි.

(ඌ) 2009 වර්ෂයේදී ගොඩනැගිලි රු.493,084 ක් ද මෝටර් වාහන රු. 404,030 ක් ද වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි.

(එ) 2009 වර්ෂයේ රු. 629,072 ක් වු පරිගණක උපකරණ, අළුත්වැඩියා වියදම් යටතේ ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේ බැර සටහන සමුච්චිත අරමුදලට ගැලපිය යුතු නමුත් උපකරණ අළුත්වැඩියා වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ඒ)) "චීන කවුළුව" ස්ථාපිත කිරීම සඳහා චීන තානාපති කාර්යාලයෙන් ලැබුණු රු. 311,700 ක මුදල ආධාර හා පරිත්‍යාග ලෙස ගිණුම්ගත කරනු වෙනුවට රු.111,700 ක් " වෙනත් ආයතනවලින් ප්‍රතිපූර්ණය කළ යුතු වියදම් " ගිණුමටත් රු. 200,000 ක් සුනාමි ආධාර ගිණුමටත් බැරකර තිබු අතර එම වැය කිරීම් ගිණුම්ගත කළ ආකාරය පැහැදිලිව හදුනාගත නොහැකි විය.

(ඕ) වැඩසටහන් වියදම් පියවා ගැනීම සඳහා 2009 හා 2010 වර්ෂයන්හි අනුග්‍රහ ආයතන වලින් ලැබී " වෙනත් ආයතනවලින් ප්‍රතිපූරණය කළ යුතු මුදල් " ගිණුමට බැරකර ශේෂපත්‍රයේ දක්වා තිබූ රු. 694,519 ක් වූ මුදලින් එම වැඩසටහන් වියදම් පියවා නොගෙන වැයකළ රු. 1,095,165 ක මුදලම ආයතනයේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(ඖ) බුත්සරණ ග්‍රන්ථය සංස්කරණය කිරීමෙන් අනතුරුව එහි පිරිවැය ගණනය කර තොග ගිණුමකට මාරු කරන තෙක්, "කෙරීගෙන යන වැඩ" ගිණුමක තබාගත යුතු 2009 හා 2010 වර්ෂයන්හි පිළිවෙලින් රු. 257,915 ක් හා රු. 115,392 ක් වු සංස්කරණ වියදම් ඒ ඒ වර්ෂයන්හි ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(ක) තොග ගිණුම් 5 ක 2009 වර්ෂයේ සිදු වු සංචලනයන් ගිණුම් නොගලපා 2008 දෙසැම්බර් 31 දින සිට පැවත එන රු. 13,182,764 ක් වු ශේෂයන් 2010 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයක් ලෙස දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ තොග නිකුත් කිරීම්ද නිවැරදිව තොග ගිණුම හරහා ගිණුම් ගලපා නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. 1,495,392 ක් වු ලිපිද්‍රව්‍ය , තොග ගිණුම් හරහා ගැලපීම වෙනුවට වියදම් ලෙස ලියාහැර තිබුණි.

(ච) පරිත්‍යාග කළ පොත් "පිරිවැය" ට ගිණුම් ගලපනු වෙනුවට පිරිවැය ඉක්ම වු රු. 2,670,775 ක් වු මුද්‍රිත මිලට, ගිණුම්වල ගලපා තිබුණි.

(ජ) මණ්ඩලය තුළ මුද්‍රණය කරනු ලබන "පුස්තකාල ලිපිද්‍රව්‍ය" සහ "මණ්ඩලීය ප්‍රකාශන" සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් ආශ්‍රයෙන් නිෂ්පාදිත පිරිවැය, නිමි තොග හා ඉතිරි අමුද්‍රව්‍ය හඳුනාගනු වෙනුවට මුද්‍රණය සඳහා අමුද්‍රව්‍ය ලෙස නිකුත්කර තිබූ ලිපිද්‍රව්‍ය වටිනාකම පමණක් තොග ගිණුමට ගලපා තිබුණි. නිසි ඇගයීමකින් තොරව ගබඩාවෙන් එම ලිපිද්‍රව්‍ය ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබූ රු. 494,787 ක් වු ලිපිදුව්‍ය අතරින් රු. 329,217 ක් වටිනා ලිපිද්‍රව්‍ය ඉතිරි වී තිබුණි.

(ට) පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව ජාතික ලේඛනාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබුණු නීතිමය තැන්පතු හා විවිධ පරිත්‍යාග පොත් 8631ක් සහ මිලදී ගත් පොත් 142 ක් ජාතික පොත් සංචිතයට එකතුකර තිබූ නමුත් ඒවා ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඩ) සූක්ෂම සේයාපටල හා ඉලෙක්ට්‍රොනික මූලාශ්‍ර වෙන වෙනම ගිණුම්ගත නොකර ජාතික පුස්තකාල පොත් යටතේ ගිණුම්ගත කර තිබූ අතර 2009 හා 2010 වර්ෂයන්හි එම මිලදී ගැනීම් රු. 3,267,308 ක් වී තිබුණි.

(ණ) පරිගණක මිලදී ගැනීමේ දී රදවාගත් රු. 62,907 ක් ආපසු ගෙවීමේදී එම ගිණුමට හර කරනු වෙනුවට ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(ත) 2009 දෙසැම්බර් 31 දිනට රු.887,906 ක් වූ පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිනිර්මාණය කිරීමේ සැලසුම් සකස් කිරීමේ වියදම් "කෙරීගෙන යන වැඩ" ගිණුමක් යටතේ ගිණුම් ගත නොකර ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබූ නමුත් 2010 දෙසැම්බර් 31 දක්වාම එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.2.4 නොසදන ලද පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන ගිණුම් විෂයයන් 12 ක එකතුව රු. 24,397,485 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තාවල එකතුව රු. 26,337,001 ක් වයෙන් රු. 6,169,070 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.2.5 ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වසර ගණනාවක් තිස්සේ නොවෙනස්ව ඉදිරියට එමින් පවතින රු. 74,300 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේදී ආදායමට බැර කර තිබූ "රැඳවුම් බදු" රු. 12,835 ක් හා විවිධ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබූ රු. 63,600 ක්වූ මුද්දර ගාස්තු 2010 දෙසැම්බර් 31 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන්, ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | බැංකු ශේෂ 3 ක් | 4,489,923 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| (ආ) | සනාම් ආධාර | 521,601 | වැය කිරීම් සම්බන්ධ සියළු ලියවිලි |
| (ඇ) | ටෙන්ඩර් තැන්පතු | 246,282 | උපලේඛන/කාල විශ්ලේෂණ |
| (ඈ) | සේවක ආරක්ෂක තැන්පතු | 71,200 | එම |
| (ඉ) | කර්තෘ ප්‍රකාශන පොත් සඳහා ණය හිමියෝ | 509,157 | උපලේඛන/ කාල විශ්ලේෂණ/ ශේෂ සනාථ කිරීම් |
| (ඊ) | පොත් හුවමාරු සේවය සඳහා | 152,701 | එම |

| | | | |
|---|---|---|---|
| (උ) | තැන්පතු කාර්යාල රාජකාරි සඳහා අත්තිකාරම් | 69,627 | උපලේඛන/ කාල විශ්ලේෂණ |
| (ඌ) | වෙනත් ආයතන වෙතින් ප්‍රතිපූරණය කළයුතු වියදම් | 902,026 | එම |

### 1:2.7 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 3 වගන්තිය | සභාපතිවරයෙකු ඇතුළුව 14 දෙනෙකුගෙන් යුත් සාමාජික මණ්ඩලය පත් කිරීම වසරකුත් මාස 04 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාස | |
| මු.රෙ 371(2) (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 15 කදී රු. 20,000 ඉක්මවා රු. 832,340 ක් වූ අත්තිකාරම් ලබා දී තිබූ අතර එයින් රු. 414,800 ක් වූ අත්තිකාරම් සඳහා විධිමත් අනුමත ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලින්, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.67,553,936 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.70,949,632 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.64,500,000 ක් වූ රජයේ ප්‍රදාන හේතු කරගෙන එම ඌනතාවය රු. 3,053,936 ක් දක්වා අඩු වී තිබූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.67,900,000 ක් වූ රජයේ ප්‍රදාන හේතු කරගෙන එම ඌනතාවය රු.3,049,632 ක් දක්වා අඩුවී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවයෙහි සැලකිය යුතු වෙනසක් නොමැති වුවද වර්ෂයන් දෙකෙහි ආදායම් හා වියදම් ගිණුම් තැබීමේ ප්‍රමාණාත්මක ගිණුම්කරණ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි නිවැරදිභාවය තහවුරු නොවිය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3:1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ අංශ 09 ක් යටතේ සැලසුම් කර තිබූ කාර්යයන් 67 ක් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**(අ) පොත් පරිත්‍යාග**

පූර්ව සැලසුම් සකස් කිරීමකින් තොරව විවිධ වර්ගයේ පුස්තකාල සඳහා එකම වර්ගයේ පොත් පරිත්‍යාග කර තිබීම, විධිමත් ලේඛන නඩත්තු නොකිරීම, පොත් භාරගත් ආයතන වෙතින් කුවිතාන්සි හා පරිග්‍රහන තොරතුරු ලබානොගත් අවස්ථා වීම හා ලැබීම් කුවිතාන්සි නිකුත් කිරීමේ ලේඛන සමග නොසැසඳුනු අවස්ථා වීම ආදි කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 1,105,596 ක්වූ පොත් පරිත්‍යාග වියදමෙහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

**(ආ) මණ්ඩල පොත් අලෙවිහලේ නඩත්තුව හා කාර්යසාධනය**

මණ්ඩලයේ අලෙවිහල සඳහා විධිමත් ලේඛණ හා ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම හා එහි කටයුතු අධීක්ෂණය නොකිරීම , ආරම්භයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා පොත් තොග සම්බන්ධ භෞතික සමීක්ෂණයක් සිදුනොකිරීම , අවශ්‍යතාවයන්ට ගැලපෙන පොත් නොතිබීම හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම ආදි කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අලෙවිහලට නිකුත් කළ පොත් 775 කින් පොත් 634 ක් අලෙවි නොවී පැවති අතර, පොත් අලෙවි ආදායම රු. 310,882 ක් දක්වා පෙර වර්ෂයන්ට සාපේක්ෂව 55 % කින් පහත වැටී තිබුණි.

**(ඇ) නීතිමය තැන්පතු පොත්**

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 5 ජේදයේ (ආ) 1 වගන්තිය ප්‍රකාරව ජාතික පොත් සංචිතය සඳහා අත්පත් කර ගැනීමට මණ්ඩලය වෙත බලය පැවරී ඇති ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රකාශන

නියමිත පර්දි මණ්ඩලය වෙත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබූ අතර මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද පොත් සම්බන්ධ නියැදි විගණන පරීක්ෂාවේදී ආයතන 13 කින් මිලදී ගන්නා ලද රු. 57,182 ක් වටිනා පොත් 189 කින් රු. 37,798 ක් වටිනා පොත් 110 ක් ආයතනය වෙත ලැබී නොතිබුණි.

(ඇ) **ගබඩා පාලනය**

තොග සමීක්ෂණය හා සම්බන්ධ කාර්යයන් නියමිත කාල වකවානු තුළ සිදු නොකිරීමත් , තොග වර්ග 05 ක් භෞතික සමීක්ෂණයට ලක් නොකිරීමත්, ගබඩා සමීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දුන් භාණ්ඩ ඒකක 43 ක ඌනතාවය ඇතුළු අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමත්, භෞතික සමීක්ෂණ ශේෂයන් අගය කර ගිණුම් නොගැලපීමත් හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට සිදු කළ ගබඩා භාණ්ඩ සමීක්ෂණය ඵලදායක වී නොතිබුණි.

3.3 **හඳුනා ගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2003-2009 වර්ෂ අතර කාලය තුළ ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් නීතිමය තැන්පතු ලෙස මණ්ඩලය වෙත ලබා දී තිබූ රු.20,943 ක් වටිනා පොත් 68 ක් සහ වටිනාකම සඳහන් නොකළ පොත් 82 ක් අස්ථාන ගත වී තිබුණි.

(ආ) රු. 12,750 ක් වූ අවම මිල හේතු නොදක්වා නොසලකා හැර රු. 41,567 ක් වැය කර නාම පුවරුවක් සවිකිරීමෙන් රු. 28,817 ක පාඩුවක් සිදුවී තිබුණි.

3.4 **අවිධිමත් ගණුදෙනු**

අවස්ථා 08 කදී සිදු කළ රු. 283,601 ක් වූ ප්‍රසම්පාදන කටයුතු එම විෂයභාර නිලධාරියාගෙන් බැහැරව සිදු කර තිබුණි.

3.5 **විධිමත් අධිකාර් බලයකින් තොර ගණුදෙනු**

අනුමත නොකරන ලද ජර්නල් වවුචර් 28 ක් මගින් රු. 92,277,820 ක් වූ ගණුදෙනු සටහන් කර තිබුණි.

3.6 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ 203 ක් වූ මුළු අනුමත සේවක සංඛ්‍යාවෙන් 68 ක් ම පුරප්පාඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 40 | 19 | 21 |
| මාණ්ඩලික නොවන | 163 | 116 | 47 |
| මුළු | 203 | 135 | 68 |

(ආ) 2010 ජූනි 01 දින පුරප්පාඩු වූ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි රාජකාරි කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු විසින් ආවරණය කරමින් පැවතුණි.

(ඇ) 2009 සැප්තැම්බර් 16 දින සිට ගණකාධිකාරි තනතුර පුරප්පාඩු වී පැවතීම මණ්ඩලයේ මුල්‍ය පාලනය හා මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කෙරෙහි බලපා තිබූ අතර එය පිරවීම සඳහා අවස්ථා 2 කදී පුවත්පත් දැන්වීම් ගාස්තු ලෙස වැය කළ රු.112,672 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2009-2011 කාලය සඳහා සකස් කර තිබූ සංයුක්ත සැලැස්මෙහි මණ්ඩලයේ කළමනාකරුවන්ට නිශ්චිතව වගකීම් පැවරෙන පරිදි සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම හා මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය ඇතුළත් වී නොතිබූ අතර වාර්ෂිකව යාවත්කාලීන කරද නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඒ ඒ කාර්යයන් ඉටු කරන ලද කාල පරාසය, එක් එක් කාර්ය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හා කාර්ය ප්‍රමාණයන් දක්වා නොතිබීම හේතුවෙන් එය සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය සමඟ සමගාමී නොවූ අතරම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කළ හැකි ආකාරයට කාර්යසාධන වාර්තාද සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුළදී රු. 315,180 ක් වූ දළ වැටුපක් ලබාගන්නා ලද අභ්‍යන්තර විගණක විසින් විගණන කටයුතු සිදුකළ බවට කිසිදු ලේඛණගත සාක්ෂියක් නොතිබීමෙන් එම පත්කිරීම නිෂ්ඵල එකක් ද ගෙවූ වැටුප නිෂ්කාර්ය වියදමක් ද වී තිබුණි.

## 4.4 විගණන කමිටු

සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන කමිටුවක් පමණක් පවත්වා තිබූ අතර විගණකාධිපති වාර්තා හා විගණන විමසුම් පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

## 4.5 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.6 අයවැය පාලනය

අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කාර්ය සාධනය

(ඇ) සැලසුම් සකස් කිරීම හා අයවැය පාලනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) අත්තිකාරම්

(ඊ) ගබඩා පාලනය

(උ) කාර්ය මණ්ඩල පරිපාලනය